
# ගොඩනැගිලි සේවා ඉංජිනේරුවන්ගේ **IDH මෙහෙයුම**




කොවිඩ්-19 උවදුරෙන් මෙරට මුදවාගැනීමේ සෞඛ්‍යය සේවා ක්‍රියාන්විතයේ තීරණාත්මක කාර්යභාරයක් ඉටුවන්නේ, අංගොඩ ජාතික බෝවෙන රෝග විද්‍යාතනය (NIID) හෙවත් IDH රෝහල කේන්ද්‍ර කොටගෙනය. IDH රෝහල් අධ්‍යක්ෂක, වෛද්‍ය හසිත අත්තනායක මහතා ප්‍රමුඛ සමස්ත සුවසේවා කාර්යය මණ්ඩලය මේ සඳහා දිවා රෑ නොතකා මහත් කැපවීමෙන් කටයුතු කරනු ලබයි.

ඒ 2020 අප්‍රේල් මාසයයි. කොරෝනා බියෙන් රටම තැතිගෙන රටම lockdown වී පැවති සමයයි. අසල්වැසියෙකුගේ නිවසකට තියා ළඟම ඥාතියෙකුගේ මරණයකටවත් යාමට නොහැකිව මුළු රටම ගෙවල්වලට කොටුවී සිටි සමයයි. ඉදිරියේදී උදාවිය හැකි සමාජ ව්‍යාප්ති (Community Spread) අවදානමට IDH රෝහල සූදානම් කිරීමේ වැඩපිළිවෙලේ දී, එම රෝහලේ දැඩි සත්කාර ඒකකය (ICU Complex), කොවිඩ්-19 රෝගීන් සඳහා සත්කාර කිරීමට ගැලපෙන පරිදි නවීකරණය කිරීම අත්‍යවශ්‍යම අංගයක්ව පැවතුණි. මීට අදාළ ඉදිකිරීම් කටයුතු සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාව ඉදිරිපත්ව සිටියත්, ICU ඒකකයේ සංවාතන (Ventilation) හා වායුසමීකරණ (Air Conditioning) පද්ධතිය ඇතුළු ගොඩනැගිලි සේවා ඉංජිනේරු කටයුතු නවීකරණය කිරීම සඳහා සුදුසුකම් ඇති පාර්ශවයක් ඉදිරිපත් වී නොතිබුණි. සෞඛ්‍යය සේවා අංශය හා ත්‍රිවිධ හමුදාව හැරුණු කළ වෙනත් කිසිවෙකු IDH රෝහල අසලකටවත් යාමට බිය වූ මේ කාල වකවානුව තුල

මේ සඳහා විශේෂඥ දැනුමක් ඇති පිරිසක් සොයාගැනීම රෝහල් බලධාරීන්ට බලවත් අභියෝගයක්ව පැවතුණි.

IDH රෝහලේ අධ්‍යක්‍ෂක වෛද්‍ය හසිත අත්තනායක මහතාගේ ජංගම දුරකථනයට, IESL ගොඩනැගිලි සේවා ඉංජිනේරු කමිටුවේ (Building Services Engineering Sectional Committee) සභාපති, ඉංජිනේරු සුරන් ප්‍රනාන්දු මහතාගෙන් ඇමතුමක් ලැබෙන්නේ මේ අවස්ථාවේය. ඒ, IDH ICU ඒකකයේ ඇති ගැටළු සඳහා ඉංජිනේරුමය දායකත්වය ලබාදීමට අවශ්‍යය නම්, ඒ සඳහා තම ගොඩනැගිලි සේවා ඉංජිනේරු කණ්ඩායම ස්වේච්ඡාවෙන් ඉදිරිපත්වීමට සූදානම් බව දැනුම් දීමටයි.

රෝහල් අධ්‍යක්ෂක තුමාගේ ආරාධනයට ක්ෂණික ප්‍රතිචාර දක්වමින්, දැඩි සත්කාර ඒකකයේ පැවති තත්වය නිරීක්ෂණය කිරීම සඳහා ඉංජිනේරු සුරන් ප්‍රනාන්දු, ඉංජිනේරු පාලිත අබේවර්ධන හා ඉංජිනේරු ලසන්ත ධර්මතිලක IDH රෝහල වෙත පැමිණෙන්නේ අප්‍රේල් 11 වනදා ය. ඒ කවදා ද යත්, මෙරට සිදුවූ 7 වන කොවිඩ් මරණය වන ගල්කිස්ස ප්‍රදේශයේ මැණික් ව්‍යාපාරිකයාගේ වියෝව IDH රෝහල තුල සිදුවූ අප්‍රේල් 9 වන දායින් යන්තමින් දින 2 කට පසුවය. ඉංජිනේරු කණ්ඩායමේ නිරීක්ෂණයට මෙහිදී ලක්වන්නේ IDH රෝහලේ දැඩි සත්කාර ඒකකයයි. කොරෝනා බියෙන් රටම ඇළලී තිබෙන මොහොතක, ඔවුන් මේ සඳහා ඉදිරිපත් වන්නේ පෞද්ගලිකව තමන් එකිනෙකා ඉදිරියේ ඇති සෞඛ්‍යය අවධානමට වඩා ශ්‍රී ලාංකීය ඉංජිනේරුවන් ලෙස ජාතික ව්‍යසන අවස්ථාවකදී තමන්ගෙන් රටට ඉටුවිය යුතු ජාතික යුතුකම මුල්කොටගෙනය.











රෝහලේ ICU සංකීර්ණය ඔවුන්ගේ නිරීක්ෂණයට ලක්වෙද්දී, එහි නවීකරණ කටයුත්තේ දී අනිවාර්යයෙන්ම ඉටුකළ යුතු කාරණා 3 ක් පිළිබඳව ඔවුන්ගේ අවධානය යොමු විය. එවා නම්,

**(1)** ICU අංශයට යොමුකෙරෙන කොරෝනා රෝගියා සඳහා නිර්දේශිත තත්ත්ව එම ICU කාමර තුල ගොඩනැගීම,

**(2)** සෞඛ්‍යය සේවා කාර්යය මණ්ඩලයට (වෛද්‍ය, හෙද ආදී) කොරෝනා රෝගීන් හරහා එම රෝගය සම්ප්‍රේෂණය වීමේ අවදානම තුරන්කිරීමට කටයුතු කිරීම හා

**(3)** අසාදිතයා ප්‍රතිකාර ලබන ICU කාමරයෙන් පිටතට කොරෝනා වෛරසය පැතිරීමට ඇති හැකියාව වැලැක්වීමටයි.

මේ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා එම ICU ඒකකය තුල පහත නවීකරණ කටයුතු වහාම සිදුකල යුතු බව (ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතීන් වලට අනුකූලව) ගොඩනැගිලි සේවා ඉංජිනේරු කණ්ඩායමේ නිර්දේශය විය.

**(1)** AC/ Ventilation පද්ධතියේ ඍණ පීඩන තත්වය (Negative Pressure) ඇති කිරීම

**(2)** ප්‍රමාණවත් වාතනය හා වායු හුවමාරුව (Proper ventilation/ sufficient number of air changes) සහතික වීම

**(3)** අධි ක්‍රියාකාරීත්වයෙන් යුත් ෆිල්ටර (HEPA - High-efficiency particulate air filters) භාවිතය

**(4)** වායු සමීකරණය කළ වායු ධාරා රෝගියා වෙත යොමුකෙරෙන හා රෝගියා හරහා පිටකෙරෙන සංවාත නල (Supply/ exhaust air ducts) පද්ධතිය නවීකරණය කිරීම හා ඒවායේ වා කවුළු (air louvres) සුදුසු ලෙස ස්ථානගත කිරීම

**(5)** රෝගීන්ගේ කාමර, ICU ඒකකයේ අනෙකුත් ප්‍රදේශ වලින් වෙන්වූ වායු රෝධිත කළාප බවට පත්කිරීම

රට තුල කොවිඩ්-19 රෝගයේ ව්‍යාප්තිය ඉහල යාමට පෙර, IDH දැඩි සත්කාර ඒකකයේ නවීකරණ කටයුතු ඉටුකිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික උපදේශනය ඇතුළු ඉංජිනේරුමය දායකත්වය නොමිලේම ලබාදීමට මේ ඉංජිනේරු කණ්ඩායම එකඟ විය. ඉහත නවීකරණ කටයුතු කඩිනමින් නිමකිරීම අත්‍යවශ්‍යම කාරණයක් බැවින් මේ කණ්ඩායම සිංහල අලුත් අවුරුදු දිනයේ දී පවා මේ සද්කාර්යයේ අඛණ්ඩව නියැලුණි. ව්‍යාපෘතිය අතරතුරදී වෛද්‍ය හා හෙද කාර්යය මණ්ඩලය සමඟ නිරතුරුව සාකච්ඡා පවත්වමින් ඔවුන්ගේ අවශ්‍යතාව නිසි ලෙස හඳුනාගනිමින් සිදුකළ නවීකරණ කටයුතු පසුගිය අප්‍රේල් 26 වනදා සාර්ථක ලෙස නිමා විය.




Renovation of the MVAC System of the IDH ICU complex by IESL Building Services Engineers





මෙසේ නවීකරණය කළ IDH ICU ඒකකය නැවතත් රෝහලේ කටයුතු සඳහා බාරදීමේ අවස්ථාව 2020 අප්‍රේල් 28 වනදා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්, වෛද්‍ය අනිල් ජාසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් එම රෝහලේ දී පැවැත්විණි. IDH රෝහලේ වෛද්‍ය හා හෙද කාර්යය මණ්ඩලය විසින් සංවිධානය කළ මේ චාම් උත්සවය සඳහා IESL ගොඩනැගිලි සේවා ඉංජිනේරු කණ්ඩායම, නාවික හමුදා ඉංජිනේරු කණ්ඩායම හා මේ සද්කාර්යයට මුල්‍යමය දායකත්වය සැපයු පරිත්‍යාගශීලීන් කීපදෙනෙකු සහභාගී විය. මෙහිදී සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්තුමා සිය කෘතඥතාවය IESL ආයතනය වෙත පළකර සිටියේය. එසේම IDH රෝහලේ අධ්‍යක්ෂක තුමා විසින් IESL ආයතනයේ සභාපතිතුමා වෙත නිල ලිපියකින් සිය ස්තුතිය පළ කළේය.






දැඩි සත්කාර ඒකකය
INTENSIVE CARE UNIT
PATIENTS' ENTRANCE
VISITORS' ENTRANCE
PUSH



g Services Engineering Sectional ...
හිරු ප්‍රවෘත්ති 9.55
LIVE
NEWS
දැඩි සත්කාර ඒකකය සහ නව රසායනාගාරය...
ලොව වටා හිරු
...තා වන කොවිඩ් 19 මරණ සංඛ්‍යාව 212,265ක්...


uilding Services Engineering Sectional ...
LIVE
ඇමෙරිකානු වෛද්‍ය පර්යේෂකයින් පිරිසක් කොරෝනා වෛරසයේ නව රෝග ලක්ෂණ සොයාගනී
Digital
19:06:04


# IDH දෙවන මෙහෙයුම


කොවිඩ්-19 දෙවන රැල්ලකට මුහුණදීමට හැකි පරිදි IDH රෝහල තවදුරත් සන්නද්ධ කිරීම සඳහා දැනට සාමාන්‍ය වාට්ටුවක් ලෙස පවත්වාගෙන යන ගොඩනැගිල්ලක්, දැඩි සත්කාර ඒකකයක් බවට පත්කිරීමට IDH කළමනාකරණය තීරණය කරන ලදී. ICU ඒකකයකට ගැලපෙන වායුසමීකරණ හා සංවාතන පද්ධතියක් මෙහි අළුතින්ම ස්ථාපනය කිරීම මේ ව්‍යාපෘතියේ අනිවාර්යය අවශ්‍යතාවයකි. මේ ව්‍යාපෘතිය සඳහා දායකත්වය ලබාදෙන ලෙස රෝහල් පරිපාලනය විසින් ගොඩනැගිලි ඉංජිනේරු කමිටුව වෙත කළ ඉල්ලීම එකහෙළාම පිළිගත් ඔවුන් එම කාර්යයට වහාම අත ගැසුවේය.

එම කමිටුවේ ලේකම්, ඉංජිනේරු ලක්මාල් ඉසුරු lockdown තත්වය යටතේ පවා කණ්ඩායමේ සාමාජිකයන් අතර සම්බන්ධීකරණය අඛණ්ඩව පවත්වාගනිමින් මේ සඳහා උරදී කටයුතු කළේය. ගොඩනැගිලි සේවා ඉංජිනේරු කමිටුවේ ඉංජිනේරු ශිරාන් ජයලත්, ඉංජිනේරු සුරංග ලේකම්වසම්, ඉංජිනේරු ප්‍රසන්න නාරංගොඩ ආදී ප්‍රවීනයන් සම්බන්ධ කරගෙන Zoom තාක්ෂණය ඔස්සේ IDH වෛද්‍ය මඬුල්ල සම්බන්ධ කරගනිමින් මේ නව ICU සංකීර්ණයේ MVAC පද්ධතිය නිර්මාණ කාර්යයේ නිරතවීම සිදුවිය.










ඉංජිනේරු උපදේශක සමාගමකින් සේවය ලබාගත්තා නම්, මුදලින් රුපියල් ලක්ෂ ගණනක් වැය කළ යුතුව තිබූ කර්තව්‍යයක්, IDH රෝහල වෙත නොමිලේම ඉටුකරදීමට IESL ගොඩනැගිලි සේවා ඉංජිනේරු කමිටුවට හැකි විය. මේ MVAC පද්ධතිය නිර්මාණයට අදාළ සැලසුම් (Design drawings), ප්‍රමාණ පත්‍ර (BOQ) ආදි කටයුතු දැනට අවසන් කර ඇත. මේ MVAC පද්ධතිය ස්ථාපනය කිරීම සඳහා අදාළ නිල අනුමැතිය ලද වහාම ඒ සඳහාද සිය අධීක්ෂණ හා උපදේශක දායකත්වය ලබාදීමට ගොඩනැගිලි සේවා ඉංජිනේරු කමිටුව සුදානමින් සිටී.